## 190 හදට හද ඇදේ

හදට හද ඇදේ මලට බිඟු ඇදේ
එලෙස මහද සමිඳු දෙසට සැම වෙලේ ඇදේ //

රුවට නෙත යතෙ සැපට සිත බැදේ
එකමැ ලෙසම මගේ හදත් සුරිඳු වෙතැ ඇදේ //

වතට වත දිදී ආදරින් බැදේ
එලෙස මාද සමිඳු සමඟ ආදරින් බැදේ //

කිරට ලෙය හැරේ ළදරු කුස පිරේ
මෙලෙසැ සැමදා තැවෙන මහද සමිඳුගෙන් පිරේ //

පෙමට පෙම බදේ මවට දරු බැදේ
සැබෑ ලෙසම දුබල මා ද සමිඳුනට බැදේ //

ළහිරු රුස් ලෙසේ සගෙයි සැප පෙනේ
එසේ සමිඳු දැකුම මගේ එකමැ සැපත වේ //